# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2126/6 - 2019 ජුනි මස 03 වැනි සඳුදා - 2019.06.03**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 1/2012 (III).

**1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනත**

1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 61 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඍඅ) සහ (ඍආ) ඡේද යටතේ කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර සහ ජලජ සම්පත් සංවර්ධනය පිළිබඳ අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

පී. හැරිසන්,
කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු,
පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර
සහ ජලජ සම්පත් සංවර්ධනය පිළිබඳ අමාත්‍ය.

2019 ජුනි මස 05 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මෙම නියෝග 2019 නියමුවන් (දේශීය ධීවර බෝට්ටුවල) සඳහා ප්‍රවීණතා සහතික නිකුත් කිරීමේ නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. මෙම නියෝග, මීටර් දහයයි දශම තුනට (මීටර් 10.3) නොඅඩු දිගකින් යුතු බහුදින දේශීය ධීවර බෝට්ටුවල නියමුවන් වශයෙන් සේවය කිරීම සඳහා ඉල්ලුම් කරනු ලබන තැනැත්තන්ට අදාළ විය යුතු ය.

3. කිසිදු තැනැත්තකු විසින් (මෙහි මින්මතු ''අධ්‍යක්ෂ ජනරාල්වරයා'' යනුවෙන් හඳුන්වනු ලබන) ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද ප්‍රවීණතා සහතිකයක් හෝ එකී කාර්ය සඳහා පිළිගත් සමුද්‍රීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ලද කොක්ස්වේන් බලපත්‍රයක් ලබා නොගෙන ඉහත සඳහන් පිරිවිතරයන්ගෙන් යුක්ත බහුදින දේශීය ධීවර බෝට්ටුවක නියමුවකු වශයෙන් සේවය කරනු නොලැබිය යුතු ය.

4. 3 වන නියෝගයේ සඳහන් ප්‍රවීණතා සහතිකයක් සඳහා ඉල්ලුම් කරනු ලබන යම් තැනැත්තකු -

(අ) අවස්ථාවෝචිත පරිදි, අදාළ ලිඛිත හෝ වාචික පරීක්ෂණය පැවැත්වීමට නියමිත දිනට වයස අවුරුදු දහ අටට (18) නොඅඩු විය යුතු ය ;

(ආ) නියමුවකු වශයෙන් හෝ කාර්ය මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් මුහුදෙහි, ඉහත සඳහන් බහුදින දේශීය ධීවර බෝට්ටුවක වසර දෙකකට (2) නොඅඩු පළපුරුද්දක් තිබිය යුතු ය ; සහ

1A - PG 4539 - 2767 (2019/06)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(ඇ) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අනුමත කරන ලද යම් පිළිගත් ආයතනයක එක් සතියකට (01) නොඅඩු කාලසීමාවක් ධීවර යාත්‍රා නියමු පුහුණු වැඩසටහනක් සම්පූර්ණ කර තිබිය යුතු ය.

5. ප්‍රවීණතා සහතිකයක් ලබාගැනීම සඳහා වන ඉල්ලුම්පත්‍රය පහත දැක්වෙන ලේඛන සමග ඉදිරිපත් කළ යුතු ය :-

(අ) පිළිගත් වෛද්‍ය වෘත්තිකයකු විසින් හෝ පිළිගත් වෛද්‍ය ආයතනයක් විසින් නිකුත් කරන ලද, ඉල්ලුම්කරුගේ ශ්‍රවණ හා දෘෂ්ටි තත්ත්වය ඇතුළත් යෝග්‍යතා සහතිකයක් ;

(ආ) පහත සඳහන් ආයතනයන්ගෙන් යම් ආයතනයක් විසින්, ඉල්ලුම්කරු, සති එකකට නොඅඩු කාලපරිච්ඡේදයක්, ධීවර යාත්‍රාවක නියමුවකු වශයෙන් සාර්ථක ලෙස පුහුණුවක් ලබා ඇති බව සහතික කරමින් නිකුත් කරන ලද සහතිකයක් -

(i) 2014 අංක 31 දරන ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය ;

(ii) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත යටතේ උපාධි පිරිනැමීමේ ආයතනයක් වශයෙන් පිළිගත් කොළඹ ජාත්‍යන්තර නාවික සහ ඉංජිනේරු ආයතනය ;

(iii) 1979 අංක 51 දරන ශ්‍රී ලංකා වරාය අධිකාරිය පනත යටතේ පිහිටුවන ලද මහපොළ අභ්‍යාස ආයතනය ; හෝ

(iv) එකී කාර්ය සඳහා අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් පිළිගත් වෙනත් යම් ආයතනයක්.

(ඇ) ඉල්ලුම්කරු විසින්, ධීවර පන්න ක්‍රම, යාත්‍රා කිරීම, ගුවන් විදුලි සන්නිවේදනය, පුද්ගල ආරක්ෂාව හා ජීවිතාරක්ෂාව, ගිනි වැළැක්වීම, ගිනි නිවීම, මුහුදේදී අවශ්‍ය හදිසි ප්‍රථමාධාර, මහ මුහුදේ මසුන් ඇල්ලීම හා සමුද්‍ර දූෂණය වැළැක්වීම පිළිබඳ ජාත්‍යන්තර වගකීම් යන කාරණා ඇතුළත් ප්‍රමාණවත් පුහුණුවක් ලබා ඇති බව ඔප්පු කරනු ලබන යම් ලේඛනයක් හෝ ලේඛන.

6. මේ නියෝග යටතේ ප්‍රවීණතා සහතිකයක් ලබාගැනීම සඳහා වන සෑම ඉල්ලුම්පත්‍රයක්ම අධ්‍යක්ෂ ජනාරාල්වරයා අමතා යැවිය යුතු අතර මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ආකෘතිය අනුව විය යුතු ය.

7. සෑම සුදුසුකම්ලත් ඉල්ලුම්කරුවකු වෙත අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, අවස්ථාවෝචිත පරිදි, වාචික හෝ ලිඛිත පරීක්ෂණය පැවැත්වෙන ස්ථානය හා දිනය පිළිබඳව එම දිනට යටත් පිරිසෙයින් සතියකට පෙර ලිඛිතව දනුම් දිය යුතු ය.

8. අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, මේ නියෝග යටතේ පැවැත්වීමට නියමිත අවස්ථාවෝචිත පරිදි, වාචික හෝ ලිඛිත පරීක්ෂණයේ උසස් ප්‍රමිතීන් පවත්වා ගැනීම සඳහා එම වාචික හෝ ලිඛිත පරීක්ෂණයට අදාළ විෂය නිර්දේශය කලින් කල සංශෝධනය කරනු ලැබිය හැකි ය.

9. අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, අවස්ථාවෝචිත පරිදි, පවත්වනු ලබන වාචික හෝ ලිඛිත පරීක්ෂණයේ දී නියමිත මට්ටමට අපේක්ෂකයා ළඟා වී ඇති බවට සෑහීමට පත්වීමෙන් පසුව එම පරීක්ෂණයෙන් සති දෙකක කාලපරිච්ඡේදයක් ඇතුළත සමත් වූ අපේක්ෂකයා වෙත ප්‍රවීණතා සහතිකයක් නිකුත් කරනු ලැබිය යුතු ය.

10. අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, 9 වන නියෝගයේ සඳහන් කරනු ලබන ප්‍රවීණතා සහතිකයක් ලබාගත් යම් ඉල්ලුම්කරුවකුට මෙහි III වන උපලේඛනයේ සඳහන් බලපත්‍ර ගාස්තුව ගෙවීමෙන් පසු මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් ආකෘතිය අනුව නියමු බලපත්‍රයක් නිකුත් කරනු ලැබිය යුතු ය.

11. වාචික හෝ ලිඛිත පරීක්ෂණයේදී නියමිත මට්ටමට ළඟාවීමට නොහැකි වන යම් ඉල්ලුම්කරුවකුට 5(ආ) නියෝගයේ සඳහන් යම් ආයතනයකින් පුහුණුවක් ලබාගැනීම සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් වැඩිදුරටත් කාලසීමාවක් ලබාදිය හැකි අතර, එවැනි ඉල්ලුම්කරුවකුට එම වාචික හෝ ලිඛිත පරීක්ෂණයට මුහුණදීම සඳහා අවස්ථාවන් දෙකක් පමණක් ලබා දිය යුතු ය.

12. මේ නියෝගවල -

''නියමුවා'' යන්නෙන්, ධීවර යාත්‍රාවක් පාලනය කරනු ලබන සහ බෝට්ටුවේ ගමන් මාර්ගය, අල්ලාගනු ලබන මසුන් පිළිබඳ ඇස්තමේන්තුව හා බෝට්ටුවේ සේවකයන් හා කාර්ය මණ්ඩලය පාලනය කිරීම පිළිබඳ උපදෙස් ලබාදෙනු ලබන තැනැත්තා අදහස් වන අතර, ධීවර යාත්‍රාවක ඒ හා සමාන තත්ත්වයෙන් සේවය කරනු ලබන නෞකාධිපතිවරයකු හෝ කපිතාන්වරයකු ද ඊට ඇතුළත් වේ.

## I වන උපලේඛනය

### ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව නියමු බලපත්‍රය ලබාගැනීමේ ඉල්ලුම්පත්‍රය

| ඉල්ලුම්කරුගේ වර්ණ ඡායාරූපයක් මෙහි අලවන්න, එක් ඡායාරූපයක් මේ සමග අමුණා එවන්න. (3.5 cm x 4.5 cm) |
|---|

1. සම්පූර්ණ නම (සිංහලෙන්) :-
.............................................................................................................................................

2. සම්පූර්ණ නම (ඉංග්‍රීසියෙන්) :-

| | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | |

3. මුලකුරු සමග නම (ඉංග්‍රීසියෙන්) :-

| | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | |

4. ලිපිනය (සිංහලෙන්) :- ..................................................................................................

5. ලිපිනය (ඉංග්‍රීසියෙන්) :- ..................................................................................................

6. ජාතික හැඳුනුම්පත් අංකය :- | | | | | | | | | |
(ජාතික හැඳුනුම්පතෙහි ඡායාපිටපතක් අමුණා එවන්න)

7. විවාහක/අවිවාහක බව :- ..................................................................................................

8. උපන් දිනය : වර්ෂය | | | | | මාසය | | | දිනය | | |

9. දුරකථන අංකය :- ජංගම | | | | | | | | | | |

ස්ථාවර | | | | | | | | | | |

10. අධ්‍යාපන සුදුසුකම් :- (i) අ.පො.ස. (සා/පෙළ) [ ]

(ii) අ.පො.ස. (උ/පෙළ) [ ]

(iii) වෙනත් සුදුසුකම් ......................................................................

11. නියමු පුහුණු පාඨමාලාව පිළිබඳ විස්තර :

(i) පාඨමාලාවේ නම : ......................................................................

i

(ii) පාඨමාලාව හැදෑරූ ආයතනයේ නම : ......................................................................

(iii) පුහුණු කාලසීමාව : ......................................................................

(iv) පුහුණු සහතිකය ලද දිනය : ......................................................................

(පුහුණු සහතිකයේ සහතික කරන ලද පිටපතක් අමුණා එවන්න)

12. නියමු බලපත්‍රය ලබාගැනීම සඳහා වූ ගෙවීම් පිළිබඳ විස්තර :

(i) කුවිතාන්සි අංකය : ..............................................................................

(ii) දිනය : ..............................................................................

(iii) ගෙවන ලද මුදල : ..............................................................................

(අදාළ කුවිතාන්සියේ ඡායාපිටපතක් අමුණා එවන්න)

13. ඉල්ලුම්කරුගේ සහතිකය :

මා විසින් ඉහත සපයා ඇති තොරතුරු නිවැරදි හා සත්‍ය වන බවට මෙයින් සහතික වන අතර මේ සමග ඇති ඇමුණුමෙහි සඳහන් මහ මුහුදේ ධීවර මෙහෙයුම් සඳහා වන නියම හා කොන්දේසිවලින් බැඳී සිටින බවටද කිසිදු නීතිවිරෝධී ධීවර කටයුත්තක නිරත නොවීමටද මම එකඟ වෙමි.

දිනය .............................    ............................................

ඉල්ලුම්කරුගේ අත්සන

14. ධීවර පරීක්ෂක/ක්ෂේත්‍ර නිලධරයාගේ සහතික කිරීම :

මෙම ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කරනු ලබන ................................................ මයා ක්‍රියාකාරී ධීවරයකු වන බවත් විධිමත් පුහුණුවකින් පසු ධීවර බෝට්ටු නියමුවකු වශයෙන් කටයුතු කිරීමට අවශ්‍ය ප්‍රවීණතාව ඔහු විසින් ලබා ඇති බවත් සහතික කරමින් මෙම ඉල්ලුම්පත්‍රය මෙයින් ඉදිරිපත් කරමි.

| ........................... | ................................ | ................................. |
| --- | --- | --- |
| දිනය | ධීවර පරීක්ෂක/ක්ෂේත්‍ර නිලධරයාගේ අත්සන හා නිල මුද්‍රාව | කොට්ඨාසය |

15. නිර්දේශය

සහකාර අධ්‍යක්ෂවරයාගේ නිර්දේශය

මෙම ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කරනු ලබන ඉල්ලුම්කරු අසාධුගත ලේඛනයට ඇතුළත් කර/නොකර ඇති බවට නිර්දේශ කරනු ලබන අතර මෙම ඉල්ලුම්පත්‍රය, අවශ්‍ය කටයුතු සඳහා නිර්දේශ කර/නොකර ඉදිරිපත් කරමි.

(අනවශ්‍ය වචන කපා හරින්න)

| ............................... | .......................................... |
| --- | --- |
| දිනය | සහකාර අධ්‍යක්ෂවරයාගේ අත්සන හා නිල මුද්‍රාව |

16. නියමු බලපත්‍රය නිකුත් කිරීම අනුමත කරමි/නොකරමි.

| ............................... | .................................................. |
| --- | --- |
| දිනය | මාණ්ඩලික ශ්‍රේණියේ නිලධරයාගේ අත්සන හා නිල මුද්‍රාව |

**II** වන උපලේඛනය

ඡායාරූපය

(3.5 cm x 4.5 cm)

*නියමු බලපත්‍රය*

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

(ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලද ධීවර යාත්‍රා සඳහා වලංගු වේ.)

ශ්‍රී ලංකා අංකය -

නම -

ලිපිනය -

ජා. හැ. අංකය -

උපන් දිනය -

නිකුත් කළ දිනය - කාලය ඉකුත්වීමේ දිනය -

අධ්‍යක්ෂ ජනරාල්වරයා
ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකාව

නියම හා කොන්දේසි

* ධීවර යාත්‍රාවේ සේවය කරනු ලබන නියමුවා විසින් 1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනත යටතේ පනවන ලද පහත දැක්වෙන රීති හා නියෝගවල අනුකූලව කටයුතු කළ යුතු ය.

- ලියාපදිංචි අංකය හා ගුවන් විදුලි සංඥ ධීවර යාත්‍රාවේ සටහන් කළ යුතු ය.
- යාත්‍රාවේ ධීවර ආම්පන්න ලකුණු කළ යුතු ය.
- වලංගු බෝට්ටු ලියාපදිංචි කිරීමේ සහතිකය හා මෙහෙයුම් බලපත්‍රය හෝ එහි සහතික කරන ලද පිටපත් හා ලොග් පොත බෝට්ටුවේ තබාගත යුතු ය.
- ධීවර යාත්‍රාවේ ඇති කරමල් දූල්, දිගින් කිලෝමීටර් දෙකයි දශම පහකට නොවැඩි විය යුතු ය.

නියමුවා විසින්

- ලෝග පොත නිසියාකාරව පවත්වාගත යුතු අතර සෑම ධීවර ගමන් වාරයක් අවසානයේ දී ම වරායේ සිටින බලයලත් නිලධරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.
- වෙනත් මුහුදුබඩ රාජ්‍යවල අනන්‍ය ආර්ථික කලාපවල මසුන් ඇල්ලීම නොකළ යුතු ය.
- කස මෝර විශේෂ, Ocean whitetip Shark (පොල් කොළ මෝරා), තල්මස් මෝරා හා මුහුදු ක්ෂීරපායින් ඇල්ලීම, බෝට්ටුව තුළ තබා ගැනීම, ගොඩබෑම හා ප්‍රතිනැව්ගත කිරීම සිදු නොකළ යුතු ය.
- මුහුදේ දී හෝ වරායේදී සිදුකරනු ලබන පරීක්ෂා කිරීම්වලට දේශීය හෝ විදේශීය බලයලත් නිලධරයන් වෙත සහාය ලබාදිය යුතු ය.

(දෙපාර්තමේන්තුව විසින් අනුමත කරනු ලබන පුහුණු පාඨමාලාවක් හැදෑරීමෙන් පසුව පමණක් නියමු බලපත්‍රය නිකුත් කරනු ලැබේ.)

**III වන උපලේඛනය**

1. නියමු බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා නිර්දේශිත ගාස්තුව - රු. 350/-
2. එහි අනුපිටපතක් නිකුත් කිරීම සඳහා නිර්දේශිත ගාස්තුව - රු. 450/-

06 - 510

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.